# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,331 — 1965 මාර්තු 2 වැනි අඟහරුවාද — 1965.3.2**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# III වැනි කොටස—ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**38 වෙනි වගන්තියේ (අ) අකුරු විධානය යටතේ ආඥාව**

1965 අංක 100 දරණ ආඥාව

යොමු අංකය : ජේ 63/64 ඊ 963 / එල්. ඒ. එස්. 76

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අකුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වේලා තන්ත්‍රි ගුරුන්නාන්සේලාගේ කරුණාරත්න වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

වී. ටී. ජී. කරුණාරත්න,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 පෙබරවාරි මස 26 ද.

### උපලේඛනය

| (I) ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | (II) ඉඩමේ විස්තරය |
|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කයේ උප දිසාපති | කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකූරු කෝරළේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ, මාකුර වසමේ මාරපන සහ වල්දෙනිය ගමේ පිහිටි, නෙල්ලිගහමුල වත්ත, අන්ගේවල ඕවිටේ වත්ත නමැති ඒකාබද්ධ ඉඩමෙන්, පහත සඳහන් මායිම් වලින් යුත්, ප්‍රමාණයෙන් අක්කර 1ක් පමණ වූ කොටස :—<br>උතුරට : මොරගොල්ලේ කුඹුර<br>නැගෙනහිරට : කෑගල්ල–හෙට්ටිමුල්ල මහා පාර<br>දකුණට : යොජිත අඩි පාර<br>බස්නාහිරට : ලීමගහමුල වත්ත |

3—44


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි

141——ආර් 4161—1,560 (65/2)